# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2000 අංක 4 දරන ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2000 පෙබරවාරි මස 14 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2000 පෙබරවාරි මස 18 වැනි දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල** : රු. **3.50** යි.

තැපැල් ගාස්තුව : රු. **3.50** යි.

**2000 අංක 4 දරන ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත**

[සහතිකය සටහන් කළේ 2000 පෙබරවාරි මස 14 වන දින]

එල්.ඩී.-ඕ. 11/99.

**1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 2000 අංක 4 දරන ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** (මෙහි මින් මතු 'ප්‍රධාන ප්‍රඥප්තිය' යනුවෙන් සඳහන් කරනු ලබන) 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :- 1996 අංක 2 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන, (2) වන හා (3) වන උපවගන්ති ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් :-

"(1) පහත දැක්වෙන නිලධරයන්, එනම්-

(අ) (මෙහි මින් මතු "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස හෝ ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්වරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා හෝ නමින් හෝ නිලයෙන් යම් තැනැත්තකු ;

(ආ) ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂවරයා ලෙස හෝ ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂවරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා හෝ නමින් හෝ නිලයෙන් එක් තැනැත්තකු හෝ ඊට වැඩි තැනැත්තන් සංඛ්‍යාවක් ; සහ

(ඇ) මේ පනතේ කාර්ය සඳහා කලින් කල අවශ්‍ය වන වෙනත් නිලධරයන්

පත් කරනු ලැබිය යුතු ය.

2—H 004587—4,400 (99/12)

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා මේ පනතේ විධිවිධාන පරිපාලනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු ය.

(3) ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂවරයකු ලෙස හෝ ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂවරයකු ලෙස ක්‍රියා කිරීම පිණිස හෝ (1) වන උපවගන්තිය යටතේ පත් කරනු ලැබූ යම් තැනැත්තකු විසින්, මේ පනත මගින් හෝ එය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පවරා දෙනු ලැබූ බලතල සියල්ල ම හෝ ඉන් කිසිවක් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පාලනයට යටත්ව ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.''; සහ

(2) ඒ වගන්තියේ පාර්ශව සටහන වෙනුවට පහත දැක්වෙන පාර්ශව සටහන ආදේශ කිරීමෙන් :–

''අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ සෙසු නිලධරයන් පත් කිරීම.''.

අධ්‍යක්ෂ ජනරාල්වරයා යනුවෙන් කරන ලද සඳහන.

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ හෝ යම් ලිඛිත නීතියක, දැන්වීමක, නිවේදනයක, සංදේශනයක හෝ වෙනත් ලේඛනයක ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂවරයා හඟවමින් ''ධීවර සහ ජලජ සම්පත් අධ්‍යක්ෂවරයා'' හෝ ''අධ්‍යක්ෂවරයා'' යනුවෙන් කරන ලද සෑම සඳහන් කිරීමක් ම, පිළිවෙලින් ''ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්වරයා'' සහ ''අධ්‍යක්ෂ ජනරාල්වරයා'' යනුවෙන් කරන ලද සඳහන් කිරීමක් ලෙස කියවා තේරුම් ගත යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.